(b) පහත සඳහන් පරිවර්තන සිදු කළ හැකි ආකාරය දක්වන්න.
සැ. යු. ප්‍රතිකාරක හා ප්‍රතික්‍රියා තත්ත්ව උචිත ස්ථානවල සඳහන් කළ යුතුය. තුලිත රසායනික සමීකරණ ලිවීම අවශ්‍ය නැත.

(i) පොටෑසියම් අඩංගු එකම සංයෝගය ලෙස $KCl.MgCl_2.6H_2O$ භාවිතා කරමින් $KCl.MgCl_2.6H_2O \rightarrow$ සංශුද්ධ පොටෑසියම්

(ii) සල්ෆර් අඩංගු එකම සංයෝගය ලෙස $H_2SO_4$ භාවිතා කරමින් $H_2SO_4 \rightarrow$ සංශුද්ධ $BaSO_3$

(c) පොටෑසියම් සල්ෆේට් සහ පොටෑසියම් පොස්ෆේට් තිබෙන ජලීය ද්‍රාවණයක් ඔබට සපයා තිබේ. මේ ද්‍රාවණයෙහි ඇති සල්ෆේට් අයන සහ පොස්ෆේට් අයන සාන්ද්‍රණ ඔබ නිර්ණය කරන්නට තැත් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

10. (a) ඇමෝනියා වායුව නයිට්‍රික් අම්ලය බවට කාර්මිකව පරිවර්තනය කිරීමට අදළ වන රසායනය සංක්ෂිප්තව විස්තර කරන්න.

(b) නයිට්‍රික් අම්ලය උපයෝගී කර ගනිමින්, +2 ඔක්සිකරණ තත්ත්වයේ නයිට්‍රජන් ඇති සංයෝගයක් ලබාගත හැකි වන්නේ කෙසේදැයි දක්වන්න.
සැ. යු. අදළ ප්‍රතික්‍රියාව/ ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණය / සමීකරණ ලිවිය යුතුය.

(c) පරිමාව අනුව වාතයෙහි ඇති ඔක්සිජන් ප්‍රතිශතය නිර්ණය කිරීම සඳහා විද්‍යාගාරයේදී භාවිතා කරන ඇමෝනියා ඇතුළත් වන පරීක්ෂණය කෙටියෙන් විස්තර කරන්න.

11. (a) 'ඇමෝනියා සෝඩා ක්‍රමය' හා සම්බන්ධ භෞත - රසායනික මූලධර්ම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.

(b) කෝස්ටික් සෝඩා නිෂ්පාදනාගාරයකින් සිදු විය හැකි පරිසරීය දූෂණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.
සැ. යු. අදළ වන වැදගත් කරුණු හතරක් සලකා බැලීම ප්‍රමාණවත් වේ.

(c) බ්‍රෝමීන්, විද්‍යුත් සෘණ ලක්ෂණ අනුව, ක්ලෝරීන් හා අයඩීන් වලට අතරමැදි වන බව ඔබ පරීක්ෂණාත්මකව විදහා දක්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

12. (a) හුණුගල්වලින් ආරම්භ කරමින්, විරංජන කුඩු නිෂ්පාදනය කිරීම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.

(b) (i) මැටි සෑදෙන ආකාරය සහ එහි සංයුතිය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.

(ii) පස් නිදර්ශක දෙකක් ඔබට සපයා තිබේ. මේවායින් වැඩියෙන් යකඩ ඇති පස් නිදර්ශකය ඔබ හඳුනා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(c) එක්තරා විශේෂ කාර්යයක් සඳහා භාවිතා කරන රබර් වර්ගයක් වල්කනයිස් කිරීමේදී සල්ෆර්වලට අමතරව $CaCO_3$ ද උපයෝගී කරගෙන තිබේ. මේ රබර් නිදර්ශකයක ඇති $CaCO_3$ ප්‍රතිශතය ඔබ නිර්ණය කරන්නට තැත් කරන්නේ කෙසේදැයි සැකෙවින් දක්වන්න.
සැ. යු. පරීක්ෂණාත්මක විස්තර අවශ්‍ය නොවේ.

## 1993 අගෝස්තු - රසායන විද්‍යාව

### I කොටස

1. පරමාණුක ක්‍රමාංකය 42 වන මූලද්‍රව්‍යයෙන් සෑදෙන +3 කැටායනයෙහි අන්තිම උප ශක්ති මට්ටමෙහි ඇති ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව
(1) 1 වේ. (2) 2 වේ. (3) 3 වේ. (4) 4 වේ. (5) 5 වේ.

2. පොස්පරස් සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය අසත්‍ය වේද?
(1) $PCl_3$ යන සංයෝගය පවතී.
(2) $PCl_5$ යන සංයෝගය පවතී.
(3) $P_2O_3$ යන සංයෝගය පවතී.
(4) $P_2H_5$ යන සංයෝගය පවතී.
(5) $PO_4$ යන සංයෝගය නොපවතී.

3. $C_5H_{10}O$ යන අණුක සූත්‍රය ඇති, ඇරෝමැටික වළයක් ඇති, ප්‍රකාශ සක්‍රිය නොවන ඇල්කොහොල සංඛ්‍යාව
(1) 3 වේ. (2) 4 වේ. (3) 6 වේ. (4) 7 වේ. (5) 8 වේ.

4. වායුවකින් මවුල 1ක් පරිමාව විචල්‍ය භාජනයක් තුළ එක්තරා පීඩනයක් යටතේ 27°C දී තබා ඇත. මෙම භාජනයට එම වායුවෙන්ම තවත් මවුල 1.5 ක් ඇතුළත් කර, එක්තරා උෂ්ණත්වයකට රත් කරන ලදී. එම උෂ්ණත්වයේදී භාජනය තුළ පීඩනය ආරම්භ පීඩනය මෙන් දෙගුණයක් විය. පරිමාව ද ආරම්භ පරිමාව මෙන් දෙගුණයක් විය. වායුව පරිපූර්ණ ලෙස හැසිරෙන්නේ නම්, නව උෂ්ණත්වය.
(1) 800°C වේ. (2) 527°C වේ. (3) 500°C වේ.
(4) 480°C වේ. (5) 207°C වේ.

5. සීසියම් පර්අයඩේට් හි රසායනික සූත්‍රය
(1) $CSIO_4$ වේ. (2) $CsIO_3$ වේ. (3) $CsIo_4$ වේ.
(4) $CsIO_4$ වේ. (5) $ScIO_4$ වේ.

6. $C_6H_5CH(CH_3)OH$ සහ $C_6H_5C(CH_3)_2$-OH එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා මින් කුමක් කෙළින්ම උපයෝගී කරගත නොහැකි වේද?
(1) ආම්ලිකෘත පොටෑසියම් ඩයික්‍රෝමේට්
(2) ආම්ලිකෘත ඇමෝනියම් ක්‍රෝමේට්
(3) පොස්පරස් ට්‍රයික්ලෝරයිඩ
(4) ආම්ලිකෘත සෝඩියම් පර්මැන්ගනේට්
(5) සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සහ නිර්ජලීය සින්ක් ක්ලෝරයිඩ් මිශ්‍රණයක්

7. ඇපටයිට්හි මින් කුමක් තිබේද?
(1) $CaMg(PO_4)Cl$ (2) $Ca_5(PO_4)_3F$ (3) $CaH(PO_4)_3F$
(4) $Ca_3Mg(PO_4)_2$ (5) ඉහත සඳහන් කිසිවක් නැත.

8. එක්තරා උෂ්ණත්වයකදී ජලයෙහි $K_w$ අගය $1.0 \times 10^{-12}$ mol$^2$ dm$^{-6}$ වේ. සාන්ද්‍රණ $10^{-10}$ mol dm$^{-3}$ වන ජලීය $OH^-$ ද්‍රාවණයක pH අගය එම උෂ්ණත්වයේදීම, ආසන්න වශයෙන්
(1) 10.1 වේ. (2) 10 වේ. (3) 9.9 වේ.
(4) 7 වේ. (5) 6 වේ.

9. M නැමැති ද්වි - සංයුජ ලෝහය නයිට්‍රික් අම්ලය සමඟ ප්‍රතික්‍රියා කර, $N_2O$ ලබාදෙන බව උපකල්පනය කරන්න. මෙම ප්‍රතික්‍රියාවට උචිත රසායනික සමීකරණයෙහි $M:HNO_3$ මවුල අනුපාතය මින් කුමක් වේද?
(1) 4:5 වේ. (2) 1:2 වේ. (3) 2:1 වේ. (4) 2:5 වේ.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

10. $CH_3CH_2C(Cl)=C(CH_2CH_2CH_3)CH_2CH(Br)COOH$ හි IUPAC නාමය
(1) 2-බ්‍රෝමෝ-5-ක්ලෝරෝ-4-ප්‍රොපිල්-4-හෙක්සිනොයික් අම්ලය වේ.
(2) 2-බ්‍රෝමෝ-5-ක්ලෝරෝ-4-ප්‍රොපිල්-4-හෙප්ටිනොයික් අම්ලය වේ.
(3) 2-බ්‍රෝමෝ-5-ක්ලෝරෝ-4-ප්‍රොපිල්-5-හෙප්ටිනොයික් අම්ලය වේ.
(4) 5-ක්ලෝරෝ-2-බ්‍රෝමෝ-4-ප්‍රොපිල්-4-හෙප්ටිනොයික් අම්ලය වේ.
(5) 5-ක්ලෝරෝ-2-බ්‍රෝමෝ-4-ප්‍රොපිල්-5-හෙප්ටිනොයික් අම්ලය වේ.

11.


(a)

$F_3CCOOH$
(b)



(c)

$ClF_2CCOOH$
(d)

ඉහත දක්වා ඇති සංයෝගවල ආම්ලික ස්වභාව මෙසේ ආරෝහණය වේ.
(1) $a<c<b<d$ (2) $a<d<c<b$ (3) $c<a<b<d$
(4) $a<c<d<b$ (5) $c<a<d<b$

12. සල්ෆර් සාන්ද්‍ර නයිට්‍රික් අම්ලය සමඟ ප්‍රතික්‍රියා කර මේවා ලබාදෙයි.
(1) $SO_2 + N_2O + H_2O$ (2) $H_2SO_4 + NO_2 + H_2O$
(3) $SO_2 + H_2SO_4 + N_2O_5 + H_2O$ (4) $H_2SO_4 + N_2O + H_2O$
(5) $SO_2 + NO_2 + N_2O + H_2O$

13. ක්ලෝරීන් උණු සාන්ද්‍ර පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් සමඟ ප්‍රතික්‍රියා කර මේවා ලබාදෙයි.
(1) $KCl + KClO + KClO_4 + H_2O$ (2) $KCl + KClO + H_2O$
(3) $KCl + KClO_3 + H_2O$ (4) $KCl + KClO_4 + H_2O$
(5) $KClO_3 + KClO_4 + H_2O$

14. $Cr^{3+}(aq) + 3e \rightarrow Cr(s); E^{\ominus} = -0.74$ V
$X_2(l) + 2e \rightarrow 2X^-(aq); E^{\ominus} = +1.07$ V
$Cr(s) | Cr^{3+}$ (aq 1mol dm$^{-3}$) ¦ $X_2(l)$ | $X^-$ (aq 1mol dm$^{-3}$)
මේ විද්‍යුත් රසායනික කෝෂයේදී
(1) $X^-$ ඔක්සිකරණය වේ. (2) $Cr^{3+}$ ඔක්සිහරණය වේ.
(3) වි.ගා.බ. + 0.33 V වේ. (4) වි.ගා. බ. + 1.81 V වේ.
(5) වි. ගා. බ. -1.81 V වේ.

15. නියත උෂ්ණත්වයේ සමජාතීය වායු අවස්ථා රසායනික ප්‍රතික්‍රියාවක $K_p$ යන සමතුලිතතා නියතයෙහි අගය



www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(1) ප්‍රතික්‍රියකවල පීඩනය මත රඳා පවතී.
(2) ප්‍රතික්‍රියකවල ආංශික පීඩනය මත රඳා පවතී.
(3) ඵලවල ආංශික පීඩන මත රඳා පවතී.
(4) පද්ධතියේ ඇති උත්ප්‍රේරකය මත රඳා පවතී.
(5) ඉහත සඳහන් කිසිවක් මත රඳා නොපවතී.

16. 'සාපේක්ෂ අණුක ස්කන්ධය' සහ 'වාෂ්ප ඝනත්වය' යන මේවා සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?
(1) හීලියම් වැනි ඒක-පරමාණුක වායුවක් සලකන විට, සාපේක්ෂ අණුක ස්කන්ධය වාෂ්ප ඝනත්වයට සමාන වේ.
(2) පරිපූර්ණ ලෙස හැසිරෙන වායුවක වාෂ්ප ඝනත්වය එහි සාපේක්ෂ අණුක ස්කන්ධය මෙන් දෙගුණයක් වේ.
(3) $O_3$ වායුවෙහි සාපේක්ෂ අණුක ස්කන්ධය එහි වාෂ්ප ඝනත්වය මෙන් තුන් ගුණයක් වේ.
(4) $O_3$ වායුවෙහි සාපේක්ෂ අණුක ස්කන්ධය එහි වාෂ්ප ඝනත්වය මෙන් හය ගුණයකි.
(5) ඉහත ප්‍රකාශ කිසිවක් සත්‍ය නොවේ.

17. ${}^{12}_{6}C$ පරමාණුවක ස්කන්ධය
(1) $19.93 \times 10^{-24}$ g වේ. (2) $9.96 \times 10^{-24}$ g වේ.
(3) $1.66 \times 10^{-24}$ g වේ. (4) $109.3 \times 10^{-28}$ g වේ.
(5) $9.107 \times 10^{-28}$ g වේ.

18. $CH_3CH_2Br$ (a) $C_6H_5Br$ (b) $C_6H_5CH_2Br$ (c)
ඉහත සඳහන් සංයෝගවල ජලවිච්ඡේදනා පහසුව මෙසේ ආරෝහණය වේ.
(1) a<b<c (2) a<c<b (3) b<a<c (4) b<c<a (5) c<b<a

19. A නමැති අකාබනික සංයෝගය ජලයෙහිද, තනුක සල්ෆියුරික් අම්ලයෙහිද කිසිම රසායනික ප්‍රතික්‍රියාවක් ඇති නොකරමින් පහසුවෙන් ද්‍රවණය විය. A බන්සන් දැල්ලට කොළ පැහැයක් ලබා දුනි. සාන්ද්‍ර නයිට්‍රික් අම්ලය සමග රත් කළ විට, A තද පැහැති වායුවක් දුනි. A මින් කුමක් විය හැකිද?
(1) $BaBr_2$ (2) $Ba(NO_2)_2$ (3) $CrI_3$
(4) $Cu(NO_2)_2$ (5) $CuBr_2$

20. කාබනික සංයෝගයක් ලැසේන් විලයනයට භාජනය කර, නයිට්‍රජන් සඳහා පරීක්ෂා කරන ලදී. මෙම පරීක්ෂාවේදී $FeSO_4$ එකතු කළ විට, කළු පැහැති අවක්ෂේපයක් ලැබුනි. කාබනික සංයෝගය සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය වඩාත්ම උචිත වේද?
(1) සංයෝගයෙහි නයිට්‍රජන් තිබේ.
(2) සංයෝගයෙහි $SO_4^{2-}$ තිබේ.
(3) සංයෝගයෙහි සල්ෆර් සහ නයිට්‍රජන් තිබේ.
(4) සංයෝගයෙහි සල්ෆර් තිබේ.
(5) සංයෝගයෙහි සල්ෆර් සහ පොස්පරස් තිබේ.

21. B නැමැති කාබනික සංයෝගය බ්‍රෝමින් දියර විවර්ණ කරයි. B අයඩොෆෝම් ප්‍රතික්‍රියාවට පිළිතුරු දෙයි. B පහසුවෙන් ඔක්සිකරණය කළ හැකි වන අතර, එය ජලීය NaOH හි ද්‍රවණය නොවේ. එසේ වුවත්, ඔක්සිකරණ ඵලය ජලීය NaOH හි ද්‍රවණය වේ. B මින් කුමක් විය හැකිද?

(1) $CH_3CH_2CH=C(COCH_2CH_3)(CH_2OH)$
(2) $HOOC{-}CH=C(CH_2COCH_3)(CHO)$
(3) $CH_3CH=C(CH_2COCH_3)(CHO)$




22. එක්තරා උෂ්ණත්වයකදී ජලය තුළ ඇලුමිනියම් හයිඩ්‍රොක්සයිඩ් හි ද්‍රාව්‍යතාව X mol dm$^{-3}$ වේ. මේ උෂ්ණත්වයේදී ඇලුමිනියම් හයිඩ්‍රොක්සයිඩ් හි ද්‍රාව්‍යතා ගුණිතය
(1) $27X^4$ mol$^3$ dm$^{-9}$ වේ. (2) $x^4$mol$^4$ dm$^{-12}$ වේ.
(3) $9x^3$ mol$^3$dm$^{-9}$ වේ. (4) $27x^4$ mol$^4$ dm$^{-12}$ වේ.
(5) $27x^3$ mol$^3$ dm$^{-9}$ වේ.

23. 25°C දී ඒක-භාෂ්මික දුබල අම්ලයක $K_a$ අගය $1.0 \times 10^{-6}$ mol dm$^{-3}$ වේ. මෙම අම්ලයේ 1.0 mol dm$^{-3}$ ජලීය ද්‍රාවණයක pOH අගය 25°C දී කොපමණ වේද?
(25°C දී $K_w = 10^{-14}$ mol$^2$cm$^{-6}$)

(1) 3 (2) 6 (3) 8 (4) 10 (5) 11

24. කැතෝඩ කිරණ අංශුවක් මත තිබිය හැකි ආරෝපණය ප්‍රමාණාත්මකව නිර්ණය කළේ
(1) මොස්ලි විසින්ය. (2) රදර්ෆර්ඩ් විසින්ය.
(3) තොම්සන් විසින්ය. (4) මාර්ස්ඩන් විසින්ය.
(5) ඉහත සඳහන් කිසිවකු විසින්වත් නොවේ.

25. පහත සඳහන් ඔක්සයිඩවලින් ජලීය ද්‍රාවණයෙහිදී වඩාත්ම ප්‍රබල ලෙස ආම්ලික වන්නේ කුමක්ද?
(1) $N_2O_3$ (2) $P_2O_3$ (3) $P_2O_5$ (4) $Cl_2O_7$ (5) $Cl_2O$

26. $C_2H_5Cl$ සහ $C_2H_5Br$ යන මේවායින් සමන්විත වන මිශ්‍රණ සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?
(1) $C_2H_5Cl$ සාන්ද්‍රණය ඉහළ වන විට මිශ්‍රණය රවුල් නියමයෙන් ධන අපගමනය වීම් දක්වයි.
(2) $C_2H_5Br$ සාන්ද්‍රණය ඉහළ වනවිට මිශ්‍රණය රවුල් නියමයෙන් ධන අපගමනය වීම් දක්වයි.
(3) එක්තරා $C_2H_5Cl$ සාන්ද්‍රණයකදී මිශ්‍රණයේ සමස්ත වාෂ්ප පීඩනය උපරිම වේ.
(4) එක්තරා $C_2H_5Br$ සාන්ද්‍රණයකදී මිශ්‍රණයේ සමස්ත වාෂ්ප පීඩනය අවම වේ.
(5) ඉහත සඳහන් ප්‍රකාශ සියල්ලම සාවද්‍ය වේ.

27. $BrCH_2CH_2COBr$ සහ $BrCH_2COOH$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා
(1) ෆීනොල්ප්තැලීන් උපයෝගී කරගත හැකිය.
(2) මෙතිල් ඔරේන්ජ් උපයෝගී කරගත හැකිය.
(3) ජලීය සිල්වර් නයිට්‍රේට් උපයෝගී කරගත හැකිය.
(4) ඉහත සඳහන් සියල්ලම උපයෝගී කරගත හැකිය.
(5) ඉහත සඳහන් කිසිවක් උපයෝගී කරගත නොහැකිය.

28. ඉහළම ඇලුමිනියම් ප්‍රතිශතය තිබෙන්නේ මින් කුමන එකෙහිද?
(1) රූටයිල් (2) රතුකැට (3) මැටි
(4) ඇලුමිනියම් කාබනේට් (5) කළුගල්

29. පේරුවිල යපස්වල සල්ෆර් තිබෙන බව පෙන්වීම සඳහා
(1) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයක් උපයෝගී කරගත හැකිය.
(2) ඇමෝනියා ද්‍රාවණයක් උපයෝගී කරගත හැකිය.
(3) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ද්‍රාවණයක් උපයෝගී කරගත හැකිය.
(4) ඉහත සඳහන් සියල්ලම උපයෝගී කරගත හැකිය.
(5) ඉහත සඳහන් කිසිවක් උපයෝගී කරගත නොහැකිය.

30. $PCl_4^+$ කැටායනික ප්‍රභේදයේ හැඩය
(1) තලීය වේ. (2) සමචතුරස්‍ර තලීය වේ.
(3) පිරමීඩීය වේ. (4) ත්‍රියානති ද්විපිරමීඩීය වේ.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

| 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට උපදෙස් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (a), (b) පමණක් නිවැරදියි. | (b), (c) පමණක් නිවැරදියි. | (c), (d) පමණක් නිවැරදියි. | (d), (a) පමණක් නිවැරදියි. | ප්‍රතිචාර එකක් පමණක් හෝ වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ නිවැරදියි. |

31. ඇල්ෆා, බීටා සහ ගැමා කිරණ සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?
(a) ඇල්ෆා කිරණවල ගමන් මාර්ගය චුම්බක ක්ෂේත්‍ර මගින් වෙනස් කෙරේ.
(b) බීටා කිරණවල ගමන් මාර්ගය විද්‍යුත් ක්ෂේත්‍ර මගින් වෙනස් කෙරේ.
(c) ගැමා කිරණවල අයනීකාරක බලය ඉතාමත් ඉහළ වේ.
(d) ඇල්ෆා කිරණවල විනිවිද යෑමේ බලය ඉතාමත් ඉහළ වේ.

32. මින් කුමක් / කුමන ඒවා සමග ෆීනෝල් ප්‍රතික්‍රියා කරයිද?
(a) බ්‍රෝමීන් (b) ජලීය KOH
(c) ෆෝමැල්ඩිහයිඩ් (d) ජලීය $KHCO_3$

33. ජලීය $NH_4NO_3$ ද්‍රාවණයකට මෙතිල් ඔරේන්ජ් දර්ශකය බිංදු කිහිපයක් සහ මැග්නීසියම් කුඩු එකතු කර තිබේ. මෙම පද්ධතිය සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය/ ප්‍රකාශ සත්‍ය වේද?
(a) මෙතිල් ඔරේන්ජ් රතු පැහැයට හැරේ.
(b) මෙතිල් ඔරේන්ජ් කහ පැහැයට හැරේ.
(c) හයිඩ්‍රජන් මුක්ත වේ.
(d) $NO_3^-$ ඇනායනය $NH_3$ බවට ඔක්සිහරණය වේ.

34. රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව මින් කුමන සාධකය/ සාධක මත රඳා පවතීද?
(a) ඵලවල එන්තැල්පිය. (b) ප්‍රතික්‍රියාවේ එන්තැල්පි විපර්යාසය



www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

මේ පද්ධතය සම්බන්ධයෙන් මින් කුමන ප්‍රකාශය වඩාත්ම උචිත වේද?
(1) M ලෝහය Mg වන විට, යකඩ ඉතාමත් සීඝ්‍රයෙන් විඛාදනය වේ.
(2) M ලෝහය Zn වන විට, යකඩ සීඝ්‍රයෙන් විඛාදනය වේ.
(3) M ලෝහය Sn වන විට, යකඩ විඛාදනය වේ.
(4) M ලෝහය Cu වන විට, යකඩ විඛාදනය බොහෝ දුරට මන්දනය වේ.
(5) M ලෝහය Ag වන විට, යකඩ විඛාදනය සම්පූර්ණයෙන්ම නවතී.

59. මින් කුමක් ජලීය $H_2S$ සමඟ ප්‍රතික්‍රියා කරයිද?
(1) ජලීය HBr (2) ජලීය HI
(3) ජලීය $CH_3COOH$ (4) ජලීය $SO_2$
(5) ඉහත කිසිවක් ජලීය $H_2S$ සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

60. විරංජන කුඩු නිෂ්පාදනය මින් කුමක් සමඟ සම්පව සම්බන්ධ නොවේද?
(1) මුහුද (2) හුණුගල් (3) පරිසරයට හානි සිදුවීම.
(4) ජලය (5) ඇමෝනියා

## රසායන විද්‍යාව II
## 'අ' කොටස - ව්‍යුහගත රචනා

1.(a) L, M, Q සහ R යනු පිළිවෙළින් පරමාණුක ක්‍රමාංකය Z, (Z+1), (Z+2) සහ (Z+3) වන අන්තරික නොවන, මූලද්‍රව්‍ය හතරකි. L, M, සහ Q යන මූලද්‍රව්‍ය තුනෙහි පළමුවැනි අයනීකරණ ශක්තිවල විචලනය ප්‍රස්ථාරීය ලෙස පහත නිරූපණය කර ඇත.




M උභයගුණී ලක්ෂණ දක්වයි. M හි ජලෝරයිඩය අයනික ඝනයක් වේ.
(i) Q හි ක්ලෝරයිඩයේ රසායනික සූත්‍රය ලියන්න.
(ii) R හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය සාමාන්‍ය ආකාරයට ලියන්න.

(b) නයිට්‍රජන් පරමාණු දෙක සර්වසම වන $N_2F_2$ අණුව සඳහා 'තිත්-කතිර සටහන' අඳින්න.
සැ. යු. (i) එක් එක් පරමාණුවේ සංයුජතා කවචවල ඇති සියලුම ඉලෙක්ට්‍රෝන දැක්විය යුතුය.
(ii) බන්ධන සාදන ඉලෙක්ට්‍රෝන යුගලයක් ඉරකින් දැක්වූ විට, ලකුණු නොලැබේ.

(c) රසායනික බන්ධන සෑදීම සඳහා ඉලෙක්ට්‍රෝන සහභාගී වේය යන මතය සනාථ කරන නිරීක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(d) (i) $FeCl_3$ ද්‍රාවණයකට KCNS ද්‍රාවණයකින් බින්දු කිහිපයක් එකතු කරනු ලැබේ. මෙහිදී සිදුවන වර්ණ විපර්යාසය සඳහන් කරන්න.
(ii) ඉහත (i) හි සඳහන් ද්‍රාවණයට යකඩ කුඩු එකතු කර, හොඳින් සොළවනු ලැබේ. මෙහිදී වර්ණ විපර්යාසයක් සිදුවීම ඔබ අපේක්ෂා කරන්නේ නම් ඒ වර්ණ විපර්යාසය පැහැදිලිව සඳහන් කරන්න. මෙහිදී වර්ණ විපර්යාසයක් සිදුවීම ඔබ අපේක්ෂා නොකරන්නේ නම් එවග පැහැදිලිව සඳහන් කරන්න.

2.(a) ආම්ලික මාධ්‍යයේදී ක්‍රෝමේට් අයන $(CrO_4^{2-})$ මගින් ඔක්සලේට් අයන $(C_2O_4^{2-})$ ඔක්සිකරණය වීමට අදාළ තුලිත අයනික සමීකරණය ලියන්න.

(b) X නැමැති මූලද්‍රව්‍යයේ ක්ලෝරයිඩයේ ජලීය ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනය කරන ලදී. 2A වන විද්‍යුත් ධාරාවක් 900s කාලයක් තුළ ද්‍රාවණය තුළින් යැවූ විට, X මූලද්‍රව්‍යයෙන් 0.757 g මුක්ත විය. X වාෂ්පශීලී හයිඩ්‍රයිඩයක් සාදයි. මේ හයිඩ්‍රයිඩයෙහි සාපේක්ෂ අණුක ස්කන්ධය දළ වශයෙන් 125 ක් වේ. X හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය ගණනය කරන්න. (F = 96500C)

(c) පහත සඳහන් එක් එක් අවස්ථාව විද්‍යා දැක්වීම සඳහා එක් නිදර්ශනය බැගින් ඉදිරිපත් කරන්න.
(i) $H_2S$ ඔක්සිකාරකයක් ලෙස ප්‍රතික්‍රියා කිරීම
(ii) $NH_3$ අම්ලයක් ලෙස ප්‍රතික්‍රියා කිරීම.
සැ. යු. ඔබ ඉදිරිපත් කරන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලිවිය යුතුය.

3. (a) A යනු අණුක සූත්‍රය RCOOH වන සංයෝගයකි. R හි ඇත්තේ කාබන් සහ හයිඩ්‍රජන් පමණි. A සම්පූර්ණයෙන් දහනය කළ විට, $CO_2$ සහ $H_2O$ 44:9 යන ස්කන්ධ අනුපාතයෙන් ලැබුණි. A හි සාපේක්ෂ අණුක ස්කන්ධය ... (ගණනය කරන්න) ...
(C = 12; H = 1; O = 16)

(b) පහත දැක්වෙන ව්‍යුහය ඇති සංයෝගය IUPAC නාමකරණ ක්‍රමයට නම් කරන්න.

$$CH_3CH_2CH_2-\underset{\underset{CHBr_2}{|}}{\overset{}{C}}(=CH)-CH_2COOCH_3$$

සැ. යු. ජ්‍යාමිතික සමාවයවිකතාව නොසලකා හරින්න.

(c) පහත ඉදිරිපත් කර ඇති පරිවර්තන සිදු කළ හැකි ආකාරය දක්වන්න. අවශ්‍ය ප්‍රතික්‍රියක හා ප්‍රතික්‍රියා තත්ත්ව උචිත ස්ථානවල පැහැදිලිව සඳහන් කළ යුතුය.
සැ. යු. ඔබගේ යෝජිත පරිවර්තන ක්‍රම අනවශ්‍ය ලෙස දීර්ඝ වේ නම් ඔබට උපරිම ලකුණු නොලැබේ.

(i) $CH\equiv CH \rightarrow CH_3-\underset{Br}{\overset{H}{C}}-CH_2COOH$

(ii) $CH_3{}^{14}COOC_2H_5 \rightarrow CH_3{}^{14}\overset{OH}{C}-(C_6H_5)_2$

4. (a) (i) $C_2H_4$ වලට $Br_2$ ආකලනය වීම සඳහා යාන්ත්‍රණය ඉදිරිපත් කරන්න.
(ii) ඉහත ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය පිළිගනිමින්, $CH_3CH=CH_2$ වලට ICl ආකලනය වීමෙන් සෑදෙන ඵලයේ ව්‍යුහය අඳින්න.

(b) (i) B නමැති ප්‍රාථමික ඇමයිනයේ අණුක සූත්‍රය $C_4H_{11}N$ වේ. B තිබිය හැකි ව්‍යුහ සියල්ලම අඳින්න.
(ii) B ප්‍රකාශ සක්‍රිය ආකාරවලට වෙන් කළ හැකි නම්, B හි හයිඩ්‍රොක්ලෝරයිඩයේ ව්‍යුහය අඳින්න.

(c) පහත දක්වා ඇති පරිවර්තන සිදු කළ හැකි ආකාරය දක්වන්න. අවශ්‍ය ප්‍රතික්‍රියක හා ප්‍රතික්‍රියා තත්ත්ව උචිත ස්ථානවල පැහැදිලිව සඳහන් කළ යුතුය.
සැ. යු. ඔබගේ යෝජිත පරිවර්තන ක්‍රම අනවශ්‍ය ලෙස දීර්ඝ වේ නම් ඔබට උපරිම ලකුණු නොලැබේ.




## 'ආ' කොටස - රචනා

5. (a) (i) පරිපූර්ණ වායු සඳහා යෙදිය හැකි, PV = nRT යන සමීකරණය ව්‍යුත්පන්න කරන්න.
(ii) හයිඩ්‍රජන් වායුව 4.0 g සහ කිසියම් හීලියම් ස්කන්ධයක් සමන්විත, වායු මිශ්‍රණයක් උෂ්ණත්වය 273°C හා පීඩනය 2... යටතේ තබා ඇත. වායු මිශ්‍රණයට තව දුරටත් හයිඩ්‍රජන් ... g එකතු කර, මේ නව මිශ්‍රණය ස.උ.පී. තත්ත්වයට ගෙන ... ලදී. එවිට නව පරිමාව ආරම්භක පරිමාව මෙන් දෙගුණයක් ... බව සොයා ගන්නා ලදී. මිශ්‍රණයේ තිබෙන හීලියම්හි ස්කන්ධය ගණනය කරන්න. (හයිඩ්‍රජන් සහ හීලියම්හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය පිළිවෙළින් 1.00 සහ 4.00 වේ.)
සැ. යු. හයිඩ්‍රජන් සහ හීලියම් පරිපූර්ණ ලෙස හැසිරෙන බව උපකල්පනය කරන්න.

(b) ඔබට ප්‍රොපයින් $(CH_3C\equiv CH)$ නිදර්ශකයක් සපයා දී ඇත. ප්‍රොපයින් පරිපූර්ණ වායුවක් ලෙස නොහැසිරෙන බව පරීක්ෂණාත්මකව පෙන්වන්නේ කෙසේදැයි පැහැදිලි ලෙස විස්තර කරන්න.

(c) බෙන්සීන් මවුල 2ක් සහ ටොලුයීන් මවුල 3ක් ඇති ද්‍රාවණයක සමස්ත වාෂ්ප පීඩනය එක්තරා උෂ්ණත්වයකදී 280 mmHg වේ. මේ ද්‍රාවණයට තවත් බෙන්සීන් මවුල 1ක් එකතු කළ විට ලැබෙන X නමැති නව ද්‍රාවණයේ සමස්ත වාෂ්ප පීඩනය එම උෂ්ණත්වයේදී 300 mmHg වේ. මේ උෂ්ණත්වයේදී X ද්‍රාවණය සමඟ සමතුලිතව පවතින වාෂ්පයෙහි ඇති බෙන්සීන් මවුල භාගය ගණනය කරන්න.
සැ. යු. බෙන්සීන් සහ ටොලුයීන් පරිපූර්ණ ද්‍රාවණ සාදන බව උපකල්පනය කරන්න.

(d) ද්‍රව අයඩොමෙතේන් සහ එහි වාෂ්පය අතර ගතික සමතුලිතතාවයක් පවතින බව පරීක්ෂණාත්මකව පෙන්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

6. (a) $CH_3CH_2COOH$ සහ $CH_3OH$ අතර සිදුවන එස්ටරීකරණ ප්‍රතික්‍රියාව ... සිදුවන ආකාරය සංක්ෂිප්ත විස්තර කරන්න.



www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

